NATIONAL LIBRARY OF SRI LANKA 13/06/2023 14:46:08

සංගණනය

42

172761

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1981 අංක 44 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 2 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 ජූලි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල : රු. 1.30 — තැපැල් ගාස්තුව : ශත 75 යි.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් වර්ෂයේ දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා, පසුව පළවෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

NATIONAL LIBRARY OF SRI LANKA 13/06/2023 14:46:08

# 1981 අංක 44 දරන වැන්දඹු සහ අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 ජූලි මස 2 වන දින]

එල්.ඩී.—ඕ. 16/67.

වැන්දඹු සහ අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 44 දරන වැන්දඹු සහ අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඬු නාමය.)*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) වැන්දඹු සහ අනාත්දරු විශ්‍රාම වැටුප් ආඥාපනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *(431 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

(1) "අධ්‍යක්ෂවරු" යන වචනයේ අර්ථකථනය අත්හැරීමෙන් ;

(2) "දායක මුදල් ගෙවීමේ උපරිම කාලසීමාව" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'යම් දායකයකු සම්බන්ධයෙන් "දායක මුදල් ගෙවීමේ උපරිම කාලසීමාව" යන්නෙන්, ඔහු දායකයකු බවට පත් වන දිනයෙන් පටන් ගෙන එසේ දායකයකු ලෙස නොකඩව අවුරුදු තිස්පහක් සම්පූර්ණ කරන දිනය හෝ දායකයකුව සිටිමින් ම ඔහුට වයස අවුරුදු හැටපහ සම්පූර්ණ වන දිනය යන දින දෙකෙන් කවර වූ හෝ කලින් එළඹෙන දිනයෙන් අවසන් වන කාලසීමාව අදහස් විය යුතු ය. එහෙත් අදාළ දිනයේ දී හෝ එදිනට පසුව, එම යෙදුම—

(අ) අදාළ දිනයට පෙර දායකයකු ලෙස නොකඩව අවුරුදු තිස්පහක් සම්පූර්ණ කර ඇති හෝ දායකයකුව සිටියදී ම වයස අවුරුදු හැටපහ ලබා ඇති හෝ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඔහු දායකයකු බවට පත් වූ දිනයෙන් පටන් ගෙන දායකයකු ලෙස නොකඩව අවුරුදු තිස්පහක් සම්පූර්ණ කරන දිනය හෝ ඔහුට වයස අවුරුදු හැටපහ ලබන දිනය යන දින දෙකෙන් කවර වූ හෝ කලින් එළඹෙන දිනයෙන් අවසන් වන කාලසීමාව ඉන් අදහස් විය යුතු ය ;

(ආ) රජයේ සේවයෙන් අස්වීමෙන් පසු 13 වන වගන්තිය හෝ 15 වන වගන්තිය හෝ ප්‍රකාර දායකයකු ලෙස දිගටම ක්‍රියා කරන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඔහු දායකයකු ලෙස පත් වූ දිනයෙන් පටන් ගෙන දායකයකු ලෙස නොකඩව අවුරුදු තිස් පහක් සම්පූර්ණ වන දිනය හෝ දායකයකු ලෙස සිටියදී ම ඔහු වයස අවුරුදු හැටපහ ලබන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන කවර වූ හෝ දිනයෙන් අවසන් වන කාලසීමාව ඉන් අදහස් විය යුතුය ;

(ඇ) විශ්‍රාම වැටුප් මත රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දායකයකු වන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඔහු දායකයකු බවට පත්වූ දිනයෙන් පටන් ගෙන අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයෙන් අවසන් වන කාලසීමාව ඉන් අදහස් විය යුතුය;

(ඈ) අදාළ දිනයේ දී දායකයකු වූ හෝ එම දින හෝ එම දිනට පසුව දායකයකු බවට පත්වන වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, ඔහු දායකයකු බවට පත් වූ හෝ පත්වන දිනයෙන් පටන් ගෙන ඔහු රජයේ සේවයෙන් අස්වන දිනයෙන් අවසන් වන කාලසීමාව ඉන් අදහස් විය යුතු ය;';

(3) "නැවත ගෙවනු ලබන දායක මුදල" යන්නෙහි අර්ථකථනයට පෙරාතුව ම, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුලත් කිරීමෙන් :—

'"අදාළ දිනය" යන්නෙන් මේ ආඥාපනතේ කාර්ය සඳහා අදාළ දිනය ලෙස අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයකින් නියම කරනු ලබන දිනය අදහස් වේ;'; සහ

(4) "වැටුප" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"වැටුප" යන්නෙන්—

(අ) 1969 ඔක්තෝබර් මස 1 වන දිනට පෙර වූ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් දායකයා විසින් දරන ලද විශ්‍රාම වැටුප් හිමි තනතුරේ මූලික වැටුප අදහස් වන අතර දායකයාට ලැබිය හැකි හෝ ඔහු විසින් භුක්ති විඳිය හැකි යම් දීමනාවක් හෝ වෙනත් පඩිනඩි හෝ වෙනත් යම් වාසියක වටිනාකම ඇතුලත් නොවිය යුතු ය;

(ආ) 1969 ඔක්තෝබර් මස 1 වන දිනට පසුව එහෙත් 1975 අප්‍රේල් මස 1 වන දිනට පෙර වූ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණය කරන ආකාරයට, දායකයා විසින් දරන ලද විශ්‍රාම වැටුප් හිමි තනතුරේ, ඒකාබද්ධ වැටුපට අනුරූප වූ කල්පිත මූලික වැටුප අදහස් විය යුතු අතර දායකයා විසින් ලැබිය හැකි හෝ භුක්ති විඳිය හැකි යම් දීමනාවක් හෝ වෙනත් පඩිනඩි හෝ වෙනත් යම් වාසියක වටිනාකම ඇතුලත් නොවිය යුතු ය;



NATIONAL LIBRARY N L S L OF SRI LANKA 13/06/2023 14:46:08

(ඇ) 1975 අප්‍රේල් මස 1 වන දිනට පසුව වූ යම් කාලසීමාවක් සම්බන්ධයෙන් දායකයා විසින් දරන ලද විශ්‍රාම වැටුප් හිමි තනතුරේ ඒකාබද්ධ වැටුප සහ සියලු විශ්‍රාම වැටුප් හිමි දීමනා ඇතුලත් විය යුතු අතර ඒ තනතුර සම්බන්ධයෙන් යම් නිලධරයකුට ලැබෙන යම් ගාස්තු හෝ වෙනත් යම් දීමනා ඇතුලත් නොවිය යුතු ය.'.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතිෂෝජනය කිරීම.

"මේ ආඥාපනත පරිපාලනය කිරීම.

5. (1) (මෙහි මින් මතු මේ ආඥාපනතේ "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා මේ ආඥාපනතේ සාමාන්‍ය පරිපාලනය භාරව කටයුතු කළ යුතු ය.

(2) මේ ආඥාපනත මගින් අධ්‍යක්ෂවරයා වෙත පවරන ලද හෝ නියම කරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීමට හෝ කර්තව්‍යයක් හෝ කාර්යයක් ඉටු කිරීමට ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් යම් නිලධරයකුට බලය දෙනු ලැබිය හැකි ය.

(3) 1906 මාර්තු මස 14 වන දින හෝ එදිනට පෙර පත් කරන ලද රජයේ නිලධරයන් සම්බන්ධයෙන් දෙසැම්බර් මස තිස් එක් වන දිනට පෙරාතුව ම වූ මාස දොළහක කාලසීමාව තුළ මේ ආඥාපනත ප්‍රකාර ලබන ලද සහ ගෙවනු ලැබූ සියලු මුදල් පිළිබඳ සත්‍ය ගිණුමක් සෑම වර්ෂයක ම මැයි මස තිස් එක් වන දින හෝ එදිනට පෙර පිළියෙළ කරනු ලැබීමට අධ්‍යක්ෂවරයා විසින් සැලැස්විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පිළියෙළ කරනු ලැබූ ගිණුම විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු අතර ඒ ගිණුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 6 වන වගන්තියේ අතුරු වගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

NATIONAL LIBRARY OF SRI LANKA N L S L 13/06/2023 14:46:08



ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 8 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1) (අ) යම් මාසයක් සඳහා මුළු වැටුපට හෝ විශ්‍රාම වැටුපට අඩු මුදල් ප්‍රමාණයක් වැටුප හෝ විශ්‍රාම වැටුප ලෙස රජයේ නිලධරයකුට ලැබුණ ද නැතහොත් වැටුප හෝ විශ්‍රාම වැටුප ලෙස කිසිම මුදල් ප්‍රමාණයක් නොලැබුණ ද, මේ ආඥා පනත ආරම්භයේ සිට සහ ඉන් පසුව 1975 මාර්තු මස 31 වන දින දක්වා අවස්ථාවෝචිත පරිදි සෑම රජයේ සේවක යකුගේ ම මුළු වැටුපෙන් හෝ මුළු විශ්‍රාම වැටුපෙන් සියයට සතරක මාසික අඩු කිරීමක් කළ යුතු ය.

(ආ) යම් මාසයක් සඳහා මුළු වැටුපට අඩු මුදල් ප්‍රමාණ යක් වැටුප ලෙස රජයේ නිලධරයකුට ලැබුණ ද නැතහොත් වැටුප ලෙස කිසිම මුදල් ප්‍රමාණයක් නොලැබුණ ද, 1975 අප්‍රේල් මස 1 වන දින සිට සහ ඉන් පසුව සෑම රජයේ නිලධරයකුගේ ම ඒකාබද්ධ වැටුපෙන් අමාත්‍යවරයා විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි සියයට ප්‍රමාණයක මාසික අඩු කිරීමක් කළ යුතු ය.

(ඇ) 1975 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වී අදාළ දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී, යම් රජයේ නිලධරයකු රජයේ සේවයෙන් විශ්‍රාම ගිය මාසය සම්බන්ධ යෙන් අඩු කරන ලද මුදල් ප්‍රමාණයට සමාන මාසික අඩු කිරීමක් හෝ රජයේ නිලධරයකු ස්වකීය විශ්‍රාම වැටුපෙන් දායක මුදල් ගෙවීමට කැමති වන අවස්ථාවක අඩු නොකරන ලද විශ්‍රාම වැටුපෙන් සියයට සතරක අඩු කිරීමක් ඒ විශ්‍රාම වැටුපෙන් අඩු කළ යුතු ය.";

(2) (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (1අ) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුවද අදාළ දිනයේ දී හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාල සීමාවක් සම්බන්ධයෙන් රජයේ නිලධරයකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුපෙන්, එම උපවගන්තියේ සඳහන් මාසික අඩු කිරීමක් නොකළ යුතු ය.";

(3) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර පහත දැක්වෙන උපවගන්තිය ඒ වෙනුවට ආදේශ කිරීමෙන් :—

" (2) (1) වන උපවගන්තියෙහි සඳහන් අඩු කිරීම, දායකයන්ගේ වැටුපෙන් සහ විශ්‍රාම වැටුපෙන් භාණ්ඩා ගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින් හෝ ක්‍රවුන් ඒජන්තවරුන් විසින් කරනු ලබන ගෙවීම්වල දී



වැටුප සහ විශ්‍රාම වැටුප ගෙවීම කරනු ලබන සෑම අවස්ථා වක දී ම ඒ ක්‍රවුන් ඒජන්තවරුන් විසින් හෝ කළ යුතු අතර, එම මුදල "වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල" ට බැර කළ යුතු ය:

එසේ වුවද පසුව සඳහන් අවස්ථාවේ දී ඒ අඩු කිරීම ශ්‍රී ලංකාවේ සේවා නියුක්තව සිටිය විට දී ඒ දායකයාට ක්‍රවුන් ඒජන්තවරුන් විසින් රුපියල්වලින් ගෙවිය යුතු මුළු වැටුප මත හෝ ඒ දායකයා ශ්‍රී ලංකාවේ නේවාසික නම් ඔහුට රුපියල්වලින් ගෙවිය යුතු විශ්‍රාම වැටුප මත ගණනය කොට අඩු කිරීම කළ යුතු අතර එංගලන්තයේ දී ඒ දායකයාට ඒ වැටුප හෝ විශ්‍රාම වැටුප ලබා ගැනීමට හිමිකම් ඇති අනුප්‍රමාණයට ගණන් බලනු ලද ඒ වැටුපෙහි නැතහොත් විශ්‍රාම වැටුපෙහි රුපියල්වලින් ඉතිරි මුදලට සමාන ස්ටර්ලින් මුදලක් ක්‍රවුන් ඒජන්තවරුන්ගෙන් ලබා ගැනීමට ඒ දායකයාට හිමිකම් ඇත."; සහ

(4) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "එවැනි අඩු කිරීමක් නොකරනු ලැබූ අවස්ථාවක දී" සිට "භාණ්ඩා ගාරයේ ලේකම්වරයාට හෝ ක්‍රවුන් ඒජන්තවරුන්ට ගෙවිය යුතුය" යන සියලුම වචන වෙනුවට පහත දැක් වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේද යේ හෝ (ආ) ඡේදයේ සඳහන් අඩු කිරීම කර නොමැති අවස්ථාවක, සෑම රජයේ නිලධරයකු විසින් ම; මේ වගන්ති යේ (1) වන උපවගන්තිය යටතේ තමා විසින් ගෙවනු ලැබීමට නියම කරනු ලබන මුදලක්, තම වැටුප හෝ විශ්‍රාම වැටුප තමාට ලැබීමෙන් පසු දින පසළොවක් ඇතුළත භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට හෝ ක්‍රවුන් ඒජන්තවරුන්ට ගෙවිය යුතුය; නැතහොත් යම් රජයේ නිලධරයකු වැටුප් නොමැතිව නිවාඩු ලබා සිටින අවස්ථා වක ඒ රජයේ නිලධරයා විසින්, ඒ නිවාඩු පවත්නා කාල යේ දී එක් එක් සහ සෑම මාසයක දී ම පසළොස් වන දිනට පෙර, ඔහු නිවාඩු නොලබා සිටියේ නම් (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ ඔහු විසින් ගෙවිය හැකිව තිබුණ මුදලට සමාන මුදලක් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට හෝ ක්‍රවුන් ඒජන්තවරුන්ට ගෙවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"අඩු කිරීම කළ යුතු කාල සීමාව.

9. (1) (2) වන උපවගන්තියේ විධිවිධානයන්ට යටත්ව, 8 (1) වන වගන්තියේ සඳහන් අඩු කිරීම, රජයේ නිලධරයකු ඔහුට වයස අවුරුදු හැටපහ ලබන තුරුම රජයේ සේවයේ යෙදී සිටියහොත් ඒ දක්වාම ඔහුගේ වැටුපෙන් අඩු කළ යුතු අතර ඒ දිනයෙන් එය අවසන් විය යුතු ය; එසේම නිල

ධරයකු අවුරුදු තිස් පහක් එක දිගට අඩු කිරීමට භාජනය කරනු ලැබීමෙන් පසුව ද ඒ අඩු කිරීම අවසන් විය යුතු ය.

(2) (අ) අදාළ දිනයේ දී රජයේ සේවයේ සිටි යදීම දූයකයකු වන ; හෝ

(ආ) එම දිනයේ දී හෝ එදිනට පසු දූයක යකු බවට පත්වන

රජයේ නිලධරයකුගේ වැටුපෙන් 8 (1) වන වගන්තියේ සඳහන් අඩු කිරීම ඔහු රජයේ සේවයේ සිටින තාක් කල් දිගටම කළ යුතු අතර ඔහු රජයේ සේවයෙන් අස්වන දිනයේ දී එය අවසන් විය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12අ වගන්තිය සංශෝධනය කිරීම.

7. (1) ප්‍රධාන ප්‍රඥප්තියෙහි (1957 අංක 1 දරන පනතින් එයට ඇතුළත් කරන ලද) 12අ වගන්තියෙහි (2) වන උපවගන්තියෙහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ආආ) මිය ගොස්, ඔහු මියයාමෙන් පසු ඔහුගේ විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කරනු ලබයි නම්, හෝ "

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන, 1957 ජනවාරි මස 24 වන දින සිට බලපවත්වන ලෙස සැලකිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තිය, 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ අවසානයට, පහත දැක්වෙන අලුත් උප වගන්තිය එකතු කිරීමෙන් :—

" (2) මේ ආඥාපනත යටතේ අදාළ දිනයේ දී හෝ එදිනට පසුව දායකයකු වන යම් තැනැත්තකුට, (1) වන උපවගන්තියේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තිය, 15 වන වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උප වගන්තිය එකතු කිරීමෙන් :—

" (2) මේ ආඥාපනත යටතේ අදාළ දිනයේ දී හෝ එදිනට පසුව දායකයකු වන යම් තැනැත්තකුට, (1) වන උපවගන්තියේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය. ".



NATIONAL LIBRARY OF SRI LANKA N L S L 13/06/2023 14:46:08

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 23 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

" ළමයකුගේ උපත හෝ ළමයකු දරුකමට හදා ගැනීම නිලධරයා විසින් දැන්විය යුතු බව.

23. සෑම රජයේ නිලධරයකු විසින් ම, මේ ආඥාපනත සම්මතවීමෙන් පසු ඔහුට දාව උපන් හෝ ඔහු විසින් නීත්‍යනුකූලව දරුකමට හදාගන්නා ලද සෑම ළමයකුගේ ම උපන් දිනය, අවස්ථාවෝචිත පරිදි, ඒ උපතේ හෝ දරුකමට හදාගැනීමේ දින සිට මාස තුනක් ඇතුළත අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

11. 29 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 29අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" නිත්‍ය අබලතාවට පත් අනත් දරුවන්ට යාව ජීව විශ්‍රාම වැටුප්.

29අ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් පත් කරන ලද වෛද්‍ය නිලධරයන් තුන් දෙනකුගෙන් සමන්විත වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් විසින් අනත් දරුවකු ඔහුගේ ජීවනෝපාය සලසා ගැනීමට නොහැකි වන්නා වූ ශාරීරික හෝ මානසික අශක්‍යතාවකින් පෙළෙන බවට තීරණය කළ විටක ඒ අනත් දරුවාට, වයස නොතකා, මේ ආඥාපනත යටතේ යාව ජීව විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම තිබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" විශ්‍රාම වැටුප ආගණනය කරන ආකාරය.

30. මියගිය රජයේ නිලධරයකුගේ වැන්දඹුවට හෝ දරුවන්ට හිමි විශ්‍රාම වැටුප හෝ දීමනාව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වක්‍ර අනුව 57අ වගන්තියේ විධිවිධානවලට යටත්ව ආගණනය කළ යුතු ය. අමාත්‍යවරයා විසින් කලින් කල පත් කරනු ලබන ජීවන ගණකවරයකු හෝ ජීවන ගණකවරයන් විසින් ඒ වක්‍ර ගැලපීම සහ ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය. සත්තකයෙන් හෝ අපේක්ෂාවෙන් සහ ප්‍රතිවර්තනයෙන් යන කවරාකාරයකින් වුව ද මේ වගන්තිය යටතේ වැන්දඹුවන්ට හෝ දරුවන්ට ගෙවිය යුතු සියලු විශ්‍රාම වැටුප් නැවත ගැලපීමට යටත් විය යුතු ය. ඒ විශ්‍රාම වැටුප් එසේ ගලපන ලද සහ ප්‍රතිශෝධනය කරන ලද වක්‍ර අනුව ආගණනය කළ යුතු අතර ඒ අනුව අඩු හෝ වැඩි කළ යුතු ය. ".

NATIONAL LIBRARY
N L S L OF SRI LANKA 13/06/2023 14:46:08



ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අරමුදලේ වත්කම් සහ බැරකම් වාරානුකූලව ජීවනගණකීය තක්සේරු කිරීම් වලින් ලැබෙන අතිරික්ත යෙදවීම.

32. 1909 මාර්තු 31 දිනයෙහි අරමුදලේ වත්කම් සහ බැරකම් තක්සේරුව ඇතුළුව, මේ ආඥාපනතේ 31 වන වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි අරමුදලේ වත්කම් සහ බැරකම් වාරානුකූලව ජීවනගණකීය තක්සේරු කිරීම්වලින් අනාවරණය වන්නා වූ අතිරික්තවලින් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි ප්‍රතිශත, ඒ එක් එක් තක්සේරු දිනට අරමුදලේ දායකයින්ගේ සහ අවුරුදු හැටපහ වයසට එළඹ හෝ සේවය අවසන් කරන ලද පූර්ව දායකයින්ගේ සහ ඒ එක් එක් තක්සේරු දිනට විශ්‍රාමිකයන් විය හැකි සියලු දෙනාගේම ද වැන්දඹුවන්ගේ සහ අනත්දරුවන්ගේ අනාගත විශ්‍රාම වැටුප් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව විෂයය භාර අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකි කොටස්වලින් සහ අනුපාතයන්ගෙන් සහ ආකාරයකින් වැඩි කිරීම සඳහා යෙදවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තිය 33 වන වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ;

(ආ) එම උපවගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :—

"(2) විවාහක රජයේ නිලධරයකු දායකයකු වශයෙන් සිටිය දී ළමයින් දරුකමට හදාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ ළමයින් දරුකමට හදා ගැනීමට අදාළ වෙනත් යම් නීතියක විධිවිධාන යටතේ හෝ දරුකමට හදාගන්නා ළමයකු (3) වන උපවගන්තියේ සහ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, දරුකමට හදා ගන්නා තැනැත්තාගේ දරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය. ඒ අනුව ඒ රජයේ නිලධරයාගේ ළමයකු



මේ ආඥාපනත යටතේ යම් ආකාරයක හා ප්‍රමාණයක විශ්‍රාම වැටුපකට හිමිකම් ලබන්නේ ද ඒ ආකාරයටම සහ ප්‍රමාණයටම දරුකමට හදා ගන්නා ලද ළමයා ද විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

(3) ළමයා දරුකමට හදා ගැනීමට නිර්ව්‍යාජ අධ්‍යාශයක් නොමැති බව සහ හුදෙක්ම පහසුකම් තකා දරුකමට හදා ගැනීමක් බව විශ්වාස කිරීමට අධ්‍යක්ෂවරයාට හේතු ඇත්නම් මිස, විවාහක රජයේ නිලධරයකු දායකයකු වශයෙන් සිටිය දී ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ ළමයින් දරුකමට හදා ගැනීමට අදාළ වෙනත් යම් නීතියක විධිවිධාන යටතේ හෝ දරුකමට හදා ගන්නා ළමයකු මේ ආඥාපනත යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ ළමයාට නිදහස් ජීවනෝපායක් නොමැති විටක සහ ඒ ළමයාට විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීම ඒ කාරණයට අදාළ සියලුම කරුණු අනුව සාධාරණ සහ යුක්ති සහගත යයි අධ්‍යක්ෂවරයා සලකනු ලබන්නේ නම් අධ්‍යක්ෂවරයා විසින් ඒ ළමයාට විශ්‍රාම වැටුපක් ප්‍රදානය කිරීමට බලය දෙනු ලැබිය හැකි ය."; තවද

(ඇ) එම වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන අලුත් පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"ළමයින්ට සහ දරුකමට හදාගත් ළමයින්ට විශ්‍රාම වැටුප්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තිය 37 වන වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ අවසානයට පහත දැක්වෙන අලුත් උප වගන්තිය එකතු කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, 1976 අගෝස්තු 1 වන දින සිට සහ ඊට පසු මේ ආඥාපනත යටතේ වැන්දඹුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප, ඒ වැන්දඹුව මිය යනුයේ යම් මාසයක ද ඒ මාසයේ අවසානය තෙක් ගෙවනු ලැබිය යුතු ය.".

NATIONAL LIBRARY N L S L OF SRI LANKA 13/06/2023 14:46:08



ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 48 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) නියමිත දින හෝ ඊට පසු එහෙත් අදාළ දිනට පෙර, රජයේ සේවයේ යෙදී සිටිය දී තමාගේ දායකවීමේ උපරිම කාල සීමාව ඉකුත්වීමේ හේතුවෙන් යම් අවිවාහකයකු මේ ආඥාපනත යටතේ දායකවීම අවසන් කරන අවස්ථාවක මේ ආඥාපනත යටතේ ඔහුගේ දායක මුදල් මුළුමනින් ම ඊට අවුරුද්දකට සියයට දෙකහමාර බැගින් වූ වැල් පොලිය සමග ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(1) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකු විසින්, 49 වන වගන්තිය යටතේ තම අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීමට අසමත් වීමේ හේතුවෙන් මේ ආඥාපනත යටතේ දායක මුදල් ගෙවීම අවසන් කරනු නොලබන අවස්ථාවක—

(අ) නියමිත දිනයට පසුව එහෙත් අදාළ දිනයට පෙර යම් අවස්ථාවක ඔහු මිය යයි නම් හෝ ඒ දායක මුදල් ගෙවීම අවසන් කිරීමට තෝරා ගනියි නම්; හෝ

(ආ) ඔහු ඒ දායක මුදල් ගෙවීම නොකඩවා ම කර ගෙන යන්නේ නම්, සහ ඔහුගේ දායක මුදල් ගෙවීමේ උපරිම කාල සීමාව ඉකුත් වී යාමෙන් හෝ ඔහුගේ මරණය සිදුවීමේ හේතුවෙන්, එසේ කිරීම අවසන් කරයි නම්,

අවස්ථාවෝචිත පරිදි ඒ මරණය, තෝරා ගැනීම හෝ කාලය ඉකුත්වීයාම සිදු වූ දිනයේ දි මේ ආඥාපනත යටතේ නියමිත දිනයේ දී හෝ එයට පසුව ඔහු විසින් කරන ලද ආපසු ගෙවිය හැකි දායක මුදල් මුළුමනින් ම, ඊට අවුරුද්දකට සියයට දෙකහමාර බැගින් වූ වැල් පොලියත් සමග, ආපසු ගෙවීමක් කරනු ලැබිය යුතු ය.



තව ද එසේ කළ යුතු ආපසු ගෙවීම, ඒ කාර්යය සඳහා කරන ලද ලිඛිත ඉල්ලීමක් මත, ඒ වැන්දඹු පුරුෂයා ජීවත්ව සිටී නම් ඔහුට හෝ ඔහු මිය ගොස් නම් ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයාට හෝ උරුමක්කරුට හෝ උරුමක්කරුවන්ට හෝ කරනු ලැබිය යුතු ය.

(2) මේ ආඥාපනත යටතේ දායක මුදල් ගෙවන තැනැත්තකු නියමිත දිනයේ දී හෝ ඊට පසු—

(අ) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැතිව වැන්දඹු පුරුෂයකුව සිටිය දී රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා හෝ අන් ආකාරයකින් රජයේ සේවය හැර යන අවස්ථාවක; හෝ

(ආ) ඒ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් හෝ අන් ආකාරයකින් සේවය හැර යාමෙන් පසු වැන්දඹු පුරුෂයකු බවට පත් වන අවස්ථාවක—

(i) නියමිත දිනයට පසුව එහෙත් අදාළ දිනයට පෙර යම් අවස්ථාවක ඔහු මිය යයි නම් හෝ ඒ දායක මුදල් ගෙවීම අවසන් කිරීමට තෝරා ගනියි නම්; හෝ

(ii) ඔහු ඒ දායක මුදල් ගෙවීම නොකඩවා කරයි නම් සහ, ඔහුගේ දායක මුදල් ගෙවීමේ උපරිම කාලසීමාව ඉකුත්වීමෙන් හෝ ඔහුගේ මරණය සිදුවීමෙන් අදාළ දිනයේ දී හෝ එදිනට පෙර එසේ දායක මුදල් ගෙවීම අවසන් කරයි නම්,

අවස්ථාවෝචිත පරිදි, ඒ තෝරා ගැනීම, කාලය ඉකුත්වීම හෝ මරණය සිදු වූ දිනයේ දී, ඔහුගේ ආපසු ගෙවිය හැකි දායක මුදල් මුළුමනින් ම, ඊට අවුරුද්දකට සියයට දෙකහමාර බැගින් වූ වැල් පොලියත් සමග, ආපසු ගෙවීමක් කරනු ලැබිය යුතු ය.

තව ද එසේ කළ යුතු ආපසු ගෙවීම, ඒ කාර්යය සඳහා කරන ලද ලිඛිත ඉල්ලීමක් මත, ඒ වැන්දඹු පුරුෂයා ජීවත්ව සිටී නම්, ඔහුට හෝ ඔහු මිය ගොස් නම් ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයාට හෝ උරුමක්කරුට හෝ උරුමක්කරුවන්ට හෝ කරනු ලැබිය යුතු ය.".

NATIONAL LIBRARY N L S L OF SRI LANKA 13/06/2023 14:46:08



(2) (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

" (2අ) අදාළ දිනයට පෙර දායකයකුව සිට ඇති රජයේ නිලධරයකු ඒ අදාළ දින හෝ ඊට පසුව—

(අ) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකුව සිටිය දී රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා හෝ අන් ආකාරයකින් රජයේ සේවය හැර යන අවස්ථාවක,. හෝ

(ආ) ඒ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් හෝ අන් ආකාරයකින් ඒ සේවය හැර යාමෙන් පසු එසේ වැන්දඹු පුරුෂයකු බවට පත්වන අවස්ථාවක, හෝ

(ඇ) රජයේ සේවයේ යෙදී සිටිය දී සහ විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැතිව වැන්දඹු පුරුෂයකුව සිටිය දී මිය යන අවස්ථාවක,

අවස්ථාවෝචිත පරිදි, ඔහු හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා, හෝ උරුමක්කරු හෝ උරුමක්කරුවන්, අවුරුද්දකට සියයට දෙකහමාර බැගින් වූ වැල් පොලියත් සමඟ, ඔහුගේ ආපසු ගෙවිය හැකි දායක මුදල් මුළුමනින් ම ආපසු ගෙවීමකට හිමිකම් ලැබිය යුතු ය.

(2ආ) රජයේ නිලධරයකු අදාළ දිනයේ දී හෝ ඊට පසු දායකයකු බවට පත් වන අවස්ථාවක හා—

(අ) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැතිව වැන්දඹු පුරුෂයකුව සිටිය දී රජයේ සේවයෙන් විශ්‍රාම ගන්නා හෝ රජයේ සේවය හැර යන අවස්ථාවක, හෝ

(ආ) රජයේ සේවයේ යෙදී සිටිය දී සහ විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැතිව වැන්දඹු පුරුෂයකුව සිටිය දී මිය යන අවස්ථාවක,

ඔහු හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා හෝ උරුමක්කරු හෝ උරුමක්කරුවන්, මේ ආඥාපනත යටතේ ඔහුගේ ආපසු ගෙවිය හැකි දායක මුදල් මුළුමනින් ම, පොලියක් නොමැතිව, ආපසු ලබා ගැනීමකට හිමිකම් ලැබිය යුතු ය.".



(3) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (4) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකු, රජයේ සේවයේ යෙදී සිටිය දී, තම දායකවීමේ උපරිම කාල සීමාව ඉකුත්වීම හේතු කොට ගෙන, නියමිත දින හෝ ඊට පසු එහෙත් අදාළ දිනයට පෙර, මේ ආඥාපනත යටතේ දායක මුදල් ගෙවීම අවසන් කරන අවස්ථාවක, අවුරුද්දකට සියයට දෙක හමාර බැගින් වූ වැල් පොලියත් සමඟ, ඔහුගේ ආපසු ගෙවිය හැකි දායක මුදල් මුළුමනින් ම ආපසු ගෙවීමක් ඔහුට කරනු ලැබිය යුතු ය."; සහ

(4) එම වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (7) විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් සහිත දරුවන් නොමැති වැන්දඹු පුරුෂයකු රජයේ සේවයේ යෙදී සිටිය දී සහ මේ ආඥාපනත යටතේ දායක මුදල් ගෙවමින් සිටිය දී, නියමිත දින හෝ ඊට පසු එහෙත් අදාළ දිනයට පෙර දිනයක මිය යන අවස්ථාවක, අවුරුද්දකට සියයට දෙක හමාර බැගින් වූ වැල් පොලියත් සමඟ, ඔහුගේ ආපසු ගෙවිය හැකි දායක මුදල් මුළුමනින් ම ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට හෝ උරුමක්කරුට හෝ උරුමක්කරුවන්ට ගෙවනු ලැබිය යුතු ය.".

18. පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 51අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 51අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

" අදාළ දිනයෙහි හෝ ඉන් පසුව දායකයන් වන සහ විශ්‍රාම වැටුපක් නොමැතිව රජයේ සේවයෙන් ඉවත් වන විවාහක රජයේ නිලධරයන් ව අදාළ විය යුතු විශේෂ විධිවිධාන.

51අ. (1) (අ) අදාළ දින හෝ ඊට පසුව දායකයකු වන්නා වූ; සහ

(ආ) අවිවාහකයකු නොවන්නා වූ

යම් රජයේ නිලධරයකු රජයේ සේවය හැර යන අවස්ථාවක, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට ඔහු සුදුස්සකු නොවේ නම්, මේ ආඥාපනත යටතේ ඔහු විසින් ගෙවන ලද දායක මුදල් මුළුමනින් ම, පොලියක් නොමැතිව ඔහුට ආපසු ගෙවනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා මේ ආඥාපනත යටතේ තවදුරටත් වෙන යම් ප්‍රතිලාභයකට හිමිකම් නොලැබිය යුතු ය; තව ද, ඔහු මඟින් හෝ ඔහු යටතේ හිමිකම් ඉදිරිපත් කරනු ලබන සියලු තැනැත්තන් මේ ආඥාපනත යටතේ ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබීම අවසන් විය යුතු ය.

NATIONAL LIBRARY N L S L OF SRI LANKA 13/06/2023 14:46:08



(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ ආපසු ගෙවීමකට හිමිකම් ලබා සිටින තැනැත්තකු ඒ ආපසු ගෙවීම ලැබීමට පෙර මිය යන අවස්ථාවක, එම ආපසු ගෙවීමේ මුදල් ප්‍රමාණය ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයාට හෝ උරුමක්කරුට හෝ උරුමක්කරුවන්ට ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියෙහි (1) වන උපවගන්තියේ "1906 මාර්තු මස 14 වන දිනට පසුව" යන වචනවලින් ආරම්භව "1945 අගෝස්තු මස 3 වන දින ආණ්ඩුකාරවරයා විසින් අනුඥාත චක්‍රවලට අනුව, නියමිත දින ආරම්භවන කාලසීමාව සඳහා" යන වචනවලින් අවසන්වන සියලු වචන හා සංඛ්‍යා වෙනුවට පහත දැක්වෙන වචන හා සංඛ්‍යා ආදේශ කිරීමෙන් :—

"57අ වගන්තියේ විධිවිධානවලට යටත්ව, 1906 මාර්තු මස 14 දිනට පසුව පත් කරනු ලැබ මිය ගිය රජයේ නිලධරයන්ගේ මැන්දඹුවන් හෝ අනන්දරුවන් හිමිකම් ලබන විශ්‍රාම වැටුප්—

(අ) II වන උපලේඛනයේ සඳහන් චක්‍රවලට අනුව 1919 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා ;

(ආ) 1922 පෙබරවාරි මස 27 වන දින ආණ්ඩුකාරවරයා විසින් අනුඥාත චක්‍රවලට අනුව, 1920 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී නියමිත දිනට පෙර දින සෙන් අවසන් වන කාලසීමාව සඳහා ; සහ

(ඇ) 1945 අගෝස්තු මස 3 වන දින ආණ්ඩුකාරවරයා විසින් අනුඥාත චක්‍රවලට අනුව, නියමිත දින ආරම්භ වන කාල සීමාව සඳහා

ගණන් බැලිය යුතුව හා ගෙවිය යුතුව තිබූ සේ සලකනු ලැබිය යුතු ය."; සහ

(2) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 57අ, 57ආ, 57ඇ, 57ඈ, 57ඉ හා 57ඊ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

20. පහත දැක්වෙන අලුත් වගන්ති 57 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 57අ වගන්තිය, 57ආ වගන්තිය, 57ඇ වගන්තිය, 57ඈ වගන්තිය, 57ඉ වගන්තිය හා 57ඊ වගන්තිය යනුවෙන් බලාත්මක විය යුතුය :—

"අදාළ දිනයෙහි හෝ ඉන් පසු මිය යන ඇතැම් රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුප්වලට අදාළ විශේෂ විධිවිධාන.

57අ. (1) මේ වගන්තියේ පසුව එන විධිවිධාන, රජයේ සේවය හැර යාමෙන් පසු මේ ආඥාපනතේ 13 වන වගන්තිය යටතේ හෝ 15 වන වගන්තිය යටතේ හෝ අඛණ්ඩව දායකව ඇත්තා වූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුපට අදාළ නොවිය යුතු ය.



(2) දායකයකු වන්නා වූ හෝ දායකයකු වී සිටි තැනැත්තකු අදාළ දිනයෙහි හෝ ඉන් පසු මිය යන අවස්ථාවක, මේ ආඥාපනත යටතේ ඒ තැනැත්තා සම්බන්ධයෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුප, මේ ආඥාපනතෙහි ඊට පටහැනිව කුමක් සඳහන් වුව ද, පහත දැක්වෙන විධිවිධාන අනුව නිශ්චය කරනු ලැබිය යුතු ය :—

(අ) ඒ තැනැත්තා රජයේ සේවයේ යෙදී සිටිය දී හෝ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස එළඹීමට පෙර විශ්‍රාම ගෙන සිටිය දී හෝ ආයතන සංග්‍රහයේ දක්වා ඇති හේතු නොවන වෙනත් යම් හේතුවක් මත රජයේ සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබීමෙන් පසු හෝ මිය යන අවස්ථාවක (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත්ව ඒ විශ්‍රාම වැටුපෙහි මුදල් ප්‍රමාණය—

(i) අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ මරණය සිදුවන අවස්ථාවේ හෝ ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ හෝ ඔහුගේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය අවුරුදු විසිපහකට අඩුවේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විසිපස් අවුරුද්දක විශ්‍රාම වැටුප් හිමි සේවා කාලයක් සඳහා හෝ ඔහු මිය නොගියේ නම් හෝ විශ්‍රාම නොගත්තේ නම් අනිවාර්ය විශ්‍රාම යාමේ වයස එළඹීමේ දී ඔහු විසින් සම්පූර්ණ කළ හැකි ව තිබූ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලයක් සඳහා හෝ යන දෙකින් වඩා කෙටි කාලය සඳහා ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය ;

(ii) අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ මරණය සිදුවන අවස්ථාවේ හෝ ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ හෝ ඔහුගේ විශ්‍රාම වැටුප් හිමි සේවාකාලය අවුරුදු විසි පහකට අඩු නොවේ නම්, එම විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය :

එසේ වුව ද ඒ තැනැත්තා ඔහුගේ මරණය සිදුවන අවස්ථාවේ හෝ ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාවේ විශේෂ තනතුරක් හෝ ධුරයක්

දරන්නකු වී නම් ඒ විශ්‍රාම වැටුප් ප්‍රමාණය ඔහුගේ අවසාන වැටුපෙන් සියයට පනහකට අඩු නොවිය යුතු ය.

(ආ) ඒ තැනැත්තා අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස එළඹීමේ හේතුව මත හෝ ආයතන සංග්‍රහයේ දක්වා ඇති යම් හේතුවක් මත හෝ රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබීමෙන් පසු හෝ විශ්‍රාම ගන්වනු ලැබීමෙන් පසු හෝ මිය යන අවස්ථාවක, (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, ඒ විශ්‍රාම වැටුප ඔහුගේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

(ඇ) ඒ තැනැත්තා අදාළ දිනයට පෙර රජයේ සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ හෝ විශ්‍රාම ගන්වනු ලැබූ හෝ අවස්ථාවක, ඒ විශ්‍රාම වැටුප මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය හෝ ඒ විධිවිධාන නොමැති වූයේ නම් මේ ආඥාපනත යටතේ ගෙවිය හැකිව තිබූ මුදල් ප්‍රමාණය හෝ යන දෙකෙන් වැඩි එක විය යුතු ය.

(ඈ) ඒ තැනැත්තා ආණ්ඩුවේ අනුමතය ඇතිව ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ස්ථිර ලෙස පත් කරනු ලැබීමෙන් පසු ඔහු ඒ ව්‍යවස්ථාපිත මණ්ඩලයෙහි හෝ ඔහු පසුව මාරු කර හරින ලද වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සේවයෙහි යෙදී සිටිය දී හෝ මිය යන අවස්ථාවක හෝ ආණ්ඩුවේ සේවයෙහි සිට ඔහු පත් කරන ලද්දේ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ද ඒ ව්‍යවස්ථාපිත මණ්ඩලයෙන් හෝ ඔහු පසුව මාරු කර හරින ලද්දේ වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට ද ඒ ව්‍යවස්ථාපිත මණ්ඩලයෙන් හෝ විශ්‍රාම වැටුප් හිමි තත්ත්වයක් යටතේ විශ්‍රාම ගනු ලැබූ පසු හෝ විශ්‍රාම ගන්වනු ලැබූ පසු හෝ මිය යන අවස්ථාවක, (ඇ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, ඒ විශ්‍රාම වැටුප් ප්‍රමාණය—

(i) ඔහු අදාළ දිනයට පෙර රජයේ සේවය හැර ගියේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ඔහුගේ විශ්‍රාම වැටුප් හිමි සේවාව සම්බන්ධයෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන

NATIONAL LIBRARY OF SRI LANKA N L S L 13/06/2023 14:46:08



මුදල් ප්‍රමාණයක් හෝ මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන නොමැති වූයේ නම් මේ ආඥාපනත යටතේ ගෙවිය හැකිව තිබූ මුදල් ප්‍රමාණය හෝ යන දෙකෙන් වැඩි එක විය යුතු ය, හෝ

(ii) ඔහු අදාළ දිනයේ හෝ ඉන්පසු හෝ රජයේ සේවය හැර ගියේ නම්, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

(3) මේ වගන්තියේ—

" අනිවාර්ය විශ්‍රාම යාමේ වයස " යන්නෙන්, රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වන විට එම නිලධරයා රජයේ සේවයෙන් විශ්‍රාම යාම අනිවාර්ය වන්නේ යම් වයසක ද ඒ වයස අදහස් වේ;

" විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු මූලික විශ්‍රාම වැටුප " යන්නට මේ ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු යම් දේශගුණ ප්‍රසාද දීමනාවක් ද, වෙනත් යම් විශ්‍රාම වැටුප් හිමි දීමනා ද ඇතුළත් වන නමුත් මේ ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුපට වෙනත් යම් එකතු කිරීමක් හෝ ඒ විශ්‍රාම වැටුපේ කරන ලද යම් අඩු කිරීමක් ඇතුළත් නොවේ;

" අවසාන වැටුප " යන්නෙන්—

(අ) රජයේ සේවයෙහි යෙදී සිටිය දී මිය යන රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වන විට ඔහුගේ මරණය සිද්ධ වන අවස්ථාවේ දී නිලධරයා ලැබූ වැටුප අදහස් වේ; තව ද

(ආ) රජයේ සේවය හැර ගිය පසු මිය යන රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූ අවස්ථාවේ හෝ ඔහු රජයේ සේවයෙන් මුදා හරින ලද අවස්ථාවේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක ස්ථිර පත්වීමක් සඳහා ඔහු රජයේ සේවයෙන් මුදා හරින ලද අවස්ථාවේ හෝ එම නිලධරයා ලැබූ වැටුප අදහස් වේ:

3—ඒ 55559 (81/04)

NATIONAL LIBRARY
N L S L OF SRI LANKA
13/06/2023
14:46:08



"විශ්‍රාම වැටුප් හිමි අවස්ථා" යන්නෙන් වයස, රෝගාතුර වීම, ධුරය අහෝසි කිරීම යන හේතු හෝ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් හේතුවක් හෝ අදහස් වේ;

"විශ්‍රාම වැටුප් හිමි සේවය" යන්නෙන් රජයේ නිලධරයා විසින් නියම වශයෙන් ඉටු කරනු ලබන සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් සඳහා වූ සේවයක් ලෙස සලකනු ලබන යම් සේවාවක් අදහස් වන නමුත් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවලින් සලසා ඇති යම් විශේෂ සේවාවක් ඊට ඇතුළත් නොවේ;

"විශේෂ තනතුර හෝ ධුරය" යන්නෙන්—

(අ) ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයාගේ තනතුර හෝ ධුරය හා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල "ක" උපලේඛනයේ සඳහන් කරන ලද වෙනත් යම් තනතුරක් හෝ ධුරයක්; හා

(ආ) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 25ඇ වගන්තියේ අර්ථානුකූලව අධිකරණ නිලධරයකු වන තැනැත්තකු විසින් දරනු ලබන යම් තනතුරක් හෝ ධුරයක්

අදහස් වේ;

"ව්‍යවස්ථාපිත මණ්ඩලය" යන්නට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 48අ වගන්තියේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය; තව ද

"මාරුකර හරින ලදී" යන්නට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 48ආ වගන්තියේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

මේ ආඥාපනත යටතේ විශ්‍රාම වැටුප් හිමි සේවාවේ කොටසක් සම්බන්ධයෙන් දායක මුදල් නොගෙවන ලද රජයේ නිලධරයන් ට අදාළ විශේෂ විධිවිධාන.

57ආ. (1) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකයකු වන යම් තැනැත්තකු අදාළ දින යෙහි හෝ ඉන් පසු මේ ආඥාපනත යටතේ දායකයකු වන අවස්ථාවක, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, අධ්‍යක්ෂවරයා විසින් එම ආඥාපනත යටතේ ඒ තැනැත්තාට ගෙවිය යුතු මුදලින්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ අරමුදලට දායක වූ මුළු කාලය සඳහා ඒ දායකයාගේ වැටුප්වල මුළු එකතුවෙන් සියයට හතරකට සමාන මුදල් ප්‍රමාණයක් අඩු කළ යුතු ය. අඩු කරන ලද මුදල් ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට



ගෙවනු ලැබිය යුතු අතර, ඒ මුදල් ප්‍රමාණය අඩු කරන ලද්දේ යම් කාලයක් සම්බන්ධයෙන් ද, ඒ කාලය මේ වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා මේ ආඥාපනත යටතේ ඒ තැනැත්තා විසින් දායක මුදල් ගෙවනු ලැබූ කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ යම් තැනැත්තකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුපේ පදනම මත ගණනය කරන ලද විට හා ඒ තැනැත්තාගේ විශ්‍රාම වැටුප් හිමි සේවයට මේ ආඥාපනත යටතේ දායක මුදල් නොගෙවන ලද යම් සේවයක් ඇතුළත් වන විට, ඒ තැනැත්තා සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ විශ්‍රාම වැටුප 57අ වගන්තිය යටතේ වන අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තා සම්බන්ධයෙන් රජයෙන් ලැබිය යුතු යම් මුදල්වලින් ඒ තැනැත්තාගේ මුළු වැටුපෙන් සියයට හතරකට සමාන මුදලක් සමග මේ ආඥාපනත යටතේ දායක මුදල් නොගෙවනු ලැබූ මුළු කාලය සඳහා ඒ මුදලට වාර්ෂිකව සියයට හතරක පොලියක් අඩු කරනු ලැබිය හැකි ය.

(3) යම් තැනැත්තකු විසින් දායක මුදල් නොගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් හිමි සේවයේ සම්පූර්ණ කාලය සඳහා හෝ කොටසක් සඳහා හෝ අධ්‍යක්ෂවරයා විසින් (2) වන උපවගන්තිය යටතේ යම් අඩු කිරීමක් කළ නොහැකි අවස්ථාවක, ඒ තැනැත්තා විසින් හෝ ඔහු ජීවතුන් අතර නොමැති අවස්ථාවක මේ ආඥාපනත යටතේ මුලින් සඳහන් තැනැත්තා සම්බන්ධයෙන් විශ්‍රාම වැටුපකට හිමිකම ඇති තැනැත්තා විසින් හෝ, ඔහු එසේ කිරීමට කැමැත්තේ නම් (2) වන උපවගන්තියේ නියමයන් යටතේ අඩු නොකරන ලද මුදල් ප්‍රමාණයට සමාන මුදල් ප්‍රමාණයක් අධ්‍යක්ෂවරයාට ගෙවනු ලැබිය හැකි ය. ඒ ගෙවීම නොකරන ලද්දේ නම්, මේ ආඥාපනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප, ගෙවීම නොකරන ලද්දේ යම් මාස සම්බන්ධයෙන් ද ඒ එක් එක් සම්පූර්ණ මාසයක් සම්බන්ධයෙන් ඒ විශ්‍රාම වැටුපෙන් 1/600 කින් අඩු කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "විශ්‍රාම වැටුප් හිමි සේවය" යන්නට 57අ වගන්තියේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

ඇතැම් ගුරුවරුන් සම්බන්ධයෙන් වූ විශේෂ විධිවිධාන.

57ඇ. පාඨශාලා ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත යටතේ පිහිටුවනු ලැබූ (මේ වගන්තියෙහි මින් මතු "විශ්‍රාම වැටුප් අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ගුරු වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායකයකු වූ යම් ගුරුවරයකු, 1970 අප්‍රේල් 1 වන දින පටන්, මේ ආඥාපනත යටතේ දායකයකු වී ඇති අවස්ථාවක, ඒ ගුරුවරයා විශ්‍රාම වැටුප් අරමුදලට දායක වූ කාල සීමාවන්, 57ඈ වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා, ඒ ගුරුවරයා විසින් මේ ආඥාපනත යටතේ ගෙවිය යුතු වූ පූර්ණ දායක මුදල් ගෙවනු ලැබූ කාල සීමාවන් වශයෙන් සැලකිය යුතුය. ඒ ගුරුවරයා විසින් විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවනු ලැබූ දායක මුදල් ආණ්ඩුව විසින් ඒ ගුරුවරයා සම්බන්ධයෙන් එකී අරමුදලට ගෙවන ලද දායක මුදල් සහ ඒ දායක මුදල් සම්බන්ධයෙන් ඉපයී ඇති පොලිය ද සමග ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට පවරනු ලැබිය යුතු අතර එවැනි ගුරුවරයකුට හෝ ඒ ගුරුවරයා මගින් හෝ යටතේ හෝ හිමිකම් ඉදිරිපත් කරන යම් තැනැත්තකුට විශ්‍රාම වැටුප් අරමුදල යටතේ ප්‍රතිලාභවලට වූ හිමිකම අවසන් විය යුතුය.

සන්නද්ධ හමුදා සාමාජිකයන් සම්බන්ධයෙන් වූ විශේෂ විධිවිධාන.

57ඈ. (1) යම් විශ්‍රාම වැටුප් හිමි රජයේ නිලධරයකු සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වීම සහ ඒ අනුව, 1970 අංක 18 දරන වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයකු වීම සිදු වූ අවස්ථාවක, මේ ආඥාපනත යටතේ ඔහු අරමුදලට දායක වූ කාල සීමාවන්, ඉහත කී පනත යටතේ පිහිටුවනු ලැබූ විශ්‍රාම වැටුප් ක්‍රමයට ඔහු දායක වූ කාල සීමාවන් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, මේ ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ ආඥාපනත යටතේ අරමුදලට ගෙවූ ඔහුගේ කිසිම දායක මුදලක් ආපසු නොගෙවිය යුතු ය.

(2) යම් විවාහක රජයේ නිලධරයකු සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වූ අවස්ථාවක, මේ ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ අරමුදලට දායකවීම දිගටම කරගෙන යාම සඳහා ඒ නිලධරයාට කැමැත්ත හෝ අකමැත්ත පළ කිරීමට හැකි විය යුතු අතර ඔහු සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වීමෙන් හය මසක් ඇතුළත ඒ කැමැත්ත හෝ අකමැත්ත පළ කළ යුතුය. මේ ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ අරමුදලට දායකවීම දිගටම කරගෙන යාම සඳහා ඒ නිලධරයා කැමැත්ත පළ කරන අවස්ථාවක, ඒ නිලධරයා සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.



NATIONAL LIBRARY OF SRI LANKA 13/06/2023 14:46:08

1906 මාර්තු 14 වන දිනට පසුව පත් කරනු ලැබූ නිලධරයන් සම්බන්ධයෙන් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුතු බව.

57ඉ. 1906 මාර්තු 14 වන දිනට පසුව පත් කරනු ලැබූ රජයේ නිලධරයන් සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ ගෙවිය යුතු සියලුම විශ්‍රාම වැටුප් සහ ඒ නිලධරයන්ට හෝ ඔවුන්ගේ නීත්‍යනුකූල නියෝජිතයන්ට හෝ උරුමක්කරුට හෝ උරුමක්කරුවන්ට මේ ආඥාපනත යටතේ ආපසු ගෙවිය යුතු සියලුම මුදල් හා ගෙවිය යුතු සියලුම පොලී ප්‍රමාණයන් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර ඒවා මෙයින් ඒකාබද්ධ අරමුදලට වැය බරක් කරනු ලැබේ.

මේ ආඥාපනතේ 57අ වගන්තියේ විධිවිධාන හැර අනෙක් විධිවිධාන යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සියයට විසි පහකින් වැඩි කළ යුතු බව.

57ඊ. අදාළ දිනයේ දී හෝ ඒ දිනට පසු ආරම්භ යම් කාල සීමාවක් සඳහා (විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් 57අ වගන්තිය යටතේ ගණනය බලනු ලැබූ විශ්‍රාම වැටුප් නොවන) මේ ආඥාපනත යටතේ වැන්දඹුවන්ට හෝ අනාථ දරුවන්ට ලැබිය යුතු සියලු විශ්‍රාම වැටුප්, සන්තකයේ ඇත්තේ වුව ද, අපේක්ෂා කරනු ලබන්නේ වුව ද එමෙන්ම ආපසු ලබන්නේ වුව ද, සියයට විසි පහකින් වැඩි කරනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"53 වන වගන්තියේ සඳහන් රජයේ නිලධරයන් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමය පිළිබඳ ජීවිත ගණක විමර්ශනය.

58. 53 වන වගන්තියේ සඳහන් රජයේ නිලධරයන් සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමය පිළිබඳ විමර්ශනයක් ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි කාල වල දී, ජනාධිපතිවරයා විසින් අනුමත කරනු ලබන ජීවිත ගණකවරයකු විසින් කරනු ලැබිය යුතු ය.".

"අමාත්‍යවරයා" යන වචනය සහ "අධ්‍යක්ෂවරයා" යන වචනය ආදේශ කිරීම.

22. පහත සඳහන් පරිදි, එනම්—

(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ යම් විධිවිධානයක "අග්‍රාණ්ඩුකාරවරයා" යන වචනය යෙදෙන කවරම අවස්ථාවක හෝ වුව ද, ඒ වෙනුවට "අමාත්‍යවරයා" යන වචනය ආදේශ කරනු ලැබේ ;

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ යම් විධිවිධානයක "අධ්‍යක්ෂවරයා" යන වචනය යෙදෙන කවරම අවස්ථාවක හෝ වුව ද, ඒ වෙනුවට "අධ්‍යක්ෂවරයා" යන වචනය ආදේශ කරනු ලැබේ. තව ද, ඒ අනුව, ඒ අධ්‍යක්ෂවරයාගෙන් යම් කෙනකු හෝ වැඩි දෙනකු හෝ සියල්ලන්ම විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ ඉටු කරනු ලබන බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් සම්බන්ධයෙන් ඒ ප්‍රඥප්තියේ කෙරෙන යම් සඳහන් කිරීමක්, අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන හෝ ඉටු කරනු ලබන යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් සම්බන්ධයෙන් කෙරෙන සඳහන් කිරීමක් වශයෙන් කියවා, තේරුම් ගත යුතු ය.